## පළමුවන කියැවීම

1 රාජාවලිය 19:4-8

රාජාවලියේ පළමුවන පොතෙන් ගත් පාඨයෙකි.

**"එලියා එම ආහාරයේ සවි ශක්තියෙන් දෙවියන් වහන්සේගේ කන්ද ළඟට පැමිණියේ ය."**

එලියා මුළු දවසක ගමන් ප්‍රමාණය පාළුකරයට පිවිස රෝතෙම් නම් ගසක් යට වාඩි වී, තමා මැරෙන ලෙස ඉල්ලමින් "සමිඳාණන් වහන්ස, ඉතින් ඇත. දැන් මාගේ ප්‍රාණය ගත මැනව. මන්ද මාගේ පියවරුන්ට වඩා මම උතුම් නොවෙමි"යි කීය. මෙසේ කියා ඔහු ඒ රෝතෙම් ගස යට වැතිර නිදා ගත්තේ ය. එවිට දේව දූතයෙක් ඔහුට අත ගසා "නැගිට කන්නැ"යි කී හෙයින් ඔහු බැලූ විට තම හිස ළඟ අඟුරු පිට පිලිස්සූ රොටියක් හා වතුර භාජනයක් තිබෙනු දැක කා බී නැවත වැතිරුණේ ය. තව ද සමිඳාණන් වහන්සේගේ දූතයා දෙවන වර අවුත් ඔහුට අත ගසා, "නැගිට කන්න, ගමන නුඹට දුර වැඩි වන්නට පුළුවනැ"යි කීවේ ය. ඔහු නැගිට කා බී, ඒ ආහාරයේ සවි ශක්තියෙන් දවල් සතළිසක් හා රෑ සතළිසක් ගමන් කර දෙවියන් වහන්සේගේ කන්ද වන හෝරෙබ් ළඟට පැමිණියේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 34:1-8

පිළිතුර: හිමි තුමාණන් ගුණවත් බව අපි අත්දකින්නෙමු.

ගීය: හැම වේලේ ම හිමි තුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැනුම් මා මුවින් තොර නොවෙයි. මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි. නිහතමානි අය ඒ අසා සතුටු වෙත්වා.

මා සමග හිමි තුමන් වර්ණනා කරන්න. අපි එක්වී එතුමන්ගේ නාමය පසසමු. මම හිමි තුමන් සොයා ගියෙමි. එතුමාණෝ මට පිළිතුරු දී හැම බියෙන් මා මිදූ සේක.

එතුමන් දෙස බලන්නා ප්‍රීතියෙන් බැබළෙන්නේ ය. ඔහුගේ මුහුණ කවදාවත් ලජ්ජාවෙන් අඳුරු නොවන්නේ ය. හිමි තුමන්ට කන්නලව් කළ එක් අසරණයෙක් විය. එතුමාණෝ ඔහුගේ බස් අසා, සියලු දුක් ගැහැටවලින් ඔහු මිදූ සේක.

හිමි තුමන්ගේ දූතයා දේව බය ඇති අය වට කර, කඳවුරු බැඳ, ඔවුන් මුදා හරියි. හිමි තුමන් ගුණවත් බව ඔබ ම අත්දකීමෙන් දැනගන්න. එතුමන් කෙරේ විශ්වාසය තබන තැනැත්තේ ආසිරි ලබයි.

## දෙවන කියැවීම

එපේසි 4:30-5:2

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**"ක්‍රිස්තුස් වහන්සේ ඔබට ප්‍රේම කළාක් මෙන්, ඔබත් ප්‍රේමයෙන් ජීවත් වන්න."**

ශුද්ධාත්මයාණන් වහන්සේට දුක් නොදෙන්න. මන්ද, මිදීමේ දවසට සූදානමක් වශයෙන් ඔබ ලබා ඇති සහතිකයේ මුද්‍රාව උන් වහන්සේ ය. සියලු වෛර ක්‍රෝධ හා හැම විධි

යේ ද්වේශ පහ කරදමන්න. එකිනෙකා කෙරෙහි කරුණාව හා දයානුකම්පාව ද ඇතිව සිට, දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළින් ඔබට කමා කළාක් මෙන් ඔබත් එකිනෙකාට කමා කරන්න. ඔබ දෙවියන් වහන්සේගේ ප්‍රේමණීය දරුවන් වන බැවින්, උන් වහන්සේ මෙන් වන්නට උත්සහ කරන්න. ක්‍රිස්තුස් වහන්සේ අපට ප්‍රේම කොට, මිහිරි සුගන්ධ පූජාවක් ද යාගයක් ද වශයෙන් අප වෙනුවෙන් දෙවියන් වහන්සේට සිය ජීවිතය පරිත්‍යාග කළාක් මෙන්, ඔබත් ප්‍රේමයෙන් ජීවත් වන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ජුවාම් 14:23

ආලේලූයා! ආලේලූයා!

"යම් තැනැත්තෙක් මට ප්‍රේම කරන්නෙහි නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේය. මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු වෙතට පැමිණ ඔහු සමග වාසය කරන්නෙමු"යි ස්වාමින් වහන්සේ වදාරන සේක .

ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 6:41-51

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ස්වර්ගයෙන් පහළවන ජීවන දායක භෝජනය මම ය."**

එවිට, 'ස්වර්ගයෙන් පහළ වූ භෝජනය මම' ය යි උන්වහන්සේ වදාළ බැවින්, ජුදෙව්වරු උන්වහන්සේ ගැන මැසිවිලි කියමින්, "මොහු ජෝසෙප්ගේ පුත් ජේසුස් නොවේද? අප මොහුගේ මව ද පියා ද අඳුනන්නේ නැද්ද? 'මම ස්වර්ගයෙන් බැස්සෙමි'යි ඔහු දැන් කියන්නේ කෙසේද"යි කීහ. ජේසුස් වහන්සේ ඔවුන් අමතමින්, "ඔබ අතරෙහි මැසිවිලි නොදොඩන්න. මා එවා වදාළ පියාණන් වහන්සේ තමන් වෙත ඇද ගන්නා අයෙකුට මිස, අන් කිසිවෙකුට මා වෙතට පැමිණිය නොහැකිය. මම අන්තිම දවසේදී ඔහු උත්ථාන කරන්නෙමි. සියල්ලෝම දෙවියන් වහන්සේ විසින් උගන්වනු ලබති'යි දිවැසාවලියෙහි ලියා ඇත. දෙවියන්වහන්සේට සවන් දී, උන්වහන්සේගෙන් ඉගෙනගත් සියල්ලෝම මා වෙත එති. දෙවියන් වහන්සේ වෙතින් පැමිණි තැනැත් වහන්සේ හැර, අන් කිසිවෙකු දෙවියන් වහන්සේ දැක ඇතැයි මෙයින් අදහස් නොකරමි, උන්වහන්සේ පමණක් පියාණන් වහන්සේ දැක ඇත. ඒකාන්තයෙන්ම මම ඔබට කියමි, අදහන්නාට සදාතන ජීවනය ඇත. ජීවනදායක භෝජනය මමය. ඔබේ පියවරු කාන්තාරයේදී මන්නා කෑහ; එහෙත් ඔව්හු මිය ගියහ. මෙය වනාහි, ස්වර්ගයෙන් බැස එන භෝජනය බැවින් එයින් පෝෂණය වන කිසිදු මිනිසෙක් නොමැරෙන්නේය. ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක භෝජනය මමය. යමෙක් මේ භෝජනයෙන් වැළඳුවොත්, ඔහු සදහටම ජීවත් වන්නේය. මා විසින් දෙනු ලබන ඒ භෝජනය මාගේ මාංශය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය පිණිසය" යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.